# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2005/20 - 2017 පෙබරවාරි මස 08 වැනි බදාදා - 2017.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට රත්මලාන-මොරටුව අපජල ප්‍රතිචක්‍රීයකරන ව්‍යාපෘති අදියර II යටතේ අංක 07 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 ජනවාරි මස 27 වැනි දින.
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය.
5/2/2/1262

02 - 876

උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 551 කටුබැද්ද ග්‍රාම නිලධාරි වසමේ කටුබැද්ද ගමේ පිහිටි ගම්මැද්ද කුඹුර නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 25 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

උතුරට : ගම්මැද්ද කුඹුර ඉඩමේ කොටසක්; නැගෙනහිරට : දීප ඇළ; දකුණට: කටුබැද්ද සිට පිළියන්දල දක්වා වූ බණ්ඩාරනායක මාවත; බටහිරට: පිඹුරු අංක 2354 හි A1 ඉඩම් කැබැල්ල ; ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය: විමලා විජේතුංග මිය, අංක : 77, "සිරිමල්", බණ්ඩාරනායක මාවත, කටුබැද්ද, මොරටුව.

---

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මාතර IV වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ මිරිස්සවත්ත භූගත ජලාශය ජල කුළුණ, පොම්පාගාරය හා ස්ථාන භාරකරු නිල නිවාසය

ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
2017 ජනවාරි මස 27 වැනි දින.
5/2/2/1245

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 375 නාකුළුගමුව උතුර ග්‍රාම නිලධාරි වසමේ. නාකුළුගමුව, සියඹලාගස්ආර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඥාණසිරි දහනායක මහතා විසින් සකස් කරන ලද අංක 2014/025 දරන පිඹුරේ කැබලි අංක 4A ලෙස දැක්වෙන කොස්වත්ත *නොහොත්* සියඹලාගස්ආර දංගහවත්ත *නොහොත්* සිද්දියාගේවත්ත නමැති ඉඩමෙන් හෙක්ටයාර් 0.2023 (රූඩ් 02) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

උතුරට : පිඹුරු අංක 203 හි කැබලි අංක 1 හා 2 ඉඩම; නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 3 ඉඩම් කැබැල්ල (මීටර් 6 ක් පළල ප්‍රවේශ මාර්ගය); දකුණට: අංක 2014/025 පිඹුරේ කැබලි අංක 4B ඉඩම; බටහිරට: පිඹුරු අංක 42 හි කැබලි අංක 2 ඉඩමෙන් කොටසක්. ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය: තිස්ස වීරතුංග මහතා, 'වීර සෙවන', ගලගම හංදිය, නාකුළුගමුව.

02 - 877

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.